ශාස්ත්‍රපීඨයේ සියලු සිසුන් වෙත පේරාදෙණි විශ්වවිද්‍යාලයයේ ශාස්ත්‍රපීඨ සභාව විසින් නිකුත් කරන ලද නිවේදනය

ශාස්ත්‍රපීඨයේ සියලු සිසුන් හට පීඨයෙහි සහ විශ්වවිද්‍යාලයයෙහි සියලු පොදු පහසුකම් සහ ප්‍රදේශ නිදහසේ භුක්ති විඳීමේ හැකියාව පැවතිය යුතු බවත් සියලු සිසුන් සමාන නීතිරීතිවලට බැඳී සිටිය යුතු බවත් සියලු ආකාරයේ හිංසන, බිය වැද්දීම් සහ වෙනස් කොට සැලකීම්වලින් තොර ව සිටීම සියලු සිසුන් ගේ අයිතියක් බවත් නැවත අවධාරණය කරමින්,

පේරාදෙණි විශ්වවිද්‍යාලයයේ ශාස්ත්‍රපීඨ සභාව

- 2022. 09. 14 දින අවස්ථා දෙකක දී ශාස්ත්‍රපීඨ ආපන ශාලාවෙහි (ගෙම්බා ආපන ශාලාව ලෙස ප්‍රසිද්ධ ය.) දිවා ආහාරය ගැනීමට උත්සාහ කරමින් සිටි ස්වකීය ශිෂ්‍ය සගයනට එරෙහි ව, ආචාර්ය මණ්ඩල සාමාජිකයන් ගෙන් විවෘත ව එල්ල කෙරුණු බලවත් විරෝධය ද නොතකමින්, ඇති කරන ලද කුරිරු සහ අමානුෂික කලහය වැනි අවස්ථා පමණක් නොව, ඇතැම් ශිෂ්‍යයන් සහ ශිෂ්‍ය කණ්ඩායම් කායික සහ වාචික හිංසා සිදු කරමින්, **විශ්වවිද්‍යාලයයෙහි පොදු පහසුකම් සහ සම්පත් භුක්ති විඳීමෙන් සෙසු සිසුන් බලහත්කාරයෙන් වැළැක්වීම දැඩි ලෙස හෙළා දකියි.**

තව ද

- පෙර දින සිදු කරන ලද කුරිරු අශෝභන නීති විරෝධී ක්‍රියා වැළැක්වීම සඳහා පීඨය පියවර ගත් බැවින් පීඨාධිපතිතුමන් සහ සිසු පීඨ සාමාජිකයන් වෙත ද්වේෂ සහගත සහ පෞද්ගලික විරෝධතා එල්ල කිරීමේ බියගුලු ක්‍රියාවලට **2022. 09. 15 දින ශිෂ්‍ය සමූහයක් පීඨ පරිශ්‍රය අවහාවිත කිරීම මගින් ශාස්ත්‍රපීඨයට හානි කිරීම සහ නින්දා කිරීම දැඩි ලෙස සහ ඒකමතික ව හෙළා දකියි.** ශාස්ත්‍රපීඨයෙහි විශ්වසනීයත්වය සහ ඒකාග්‍රතාව බිඳ හෙළීමට වුවමනාවෙන් උත්සාහ කරන සිසුන් හට ශාස්ත්‍රපීඨයෙන් සහනයක් නොලැබෙන අතර ශිෂ්‍ය ප්‍රජාව තුළ ඔවුන් ගේ තත්ත්වය කෙරෙහි විශේෂ සැලකිල්ලක් නොදක්වමින් වැරදිකරුවන් හඳුනා ගැනීම සඳහා සියලු විනය ක්‍රියාමාර්ග ගන්නා බව ශාස්ත්‍රපීඨ සභාව මෙයින් දැනුම් දෙයි.

තව ද

- 2022. 09. 20 දින පෙරවරුවේ පැවැති අංශාධිපතිවරුන් ගේ රැස්වීමේ දී එකඟ වූ පරිදි, මෙම ගැටලුව සාකච්ඡා කිරීම සඳහා එදින ම පස්වරුවේ පැවති **විශේෂ පීඨ සභා රැස්වීමට ශාස්ත්‍රපීඨ ශිෂ්‍ය සංගමයේ නියෝජිතයන් ලෙස හැඳින්වෙන සිසුන් නොපැමිණීම පිළිබඳ අප්‍රසාදය පළ කරයි.** ඔවුන් රැස්වීමට ප්‍රථමයෙන් තම නොපැමිණීම සඳහා අවසරයක්

පීඨාධිපතිතුමන් වෙත ඉදිරිපත් කිරීම හෝ රැස්වීමෙන් අනතුරු ව ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් හෝ සිදු කර නොමැති බැවින් ඔවුන් රැස්වීමේ අරමුණ අවතක්සේරුවට ලක් කොට ඇති අතර පවත්නා ගැටලුව විසඳීමේ උත්සාහය කඩාකප්පල් කොට තිබේ. ශාස්ත්‍රපීඨයට ජනමාධ්‍ය ඔස්සේ දිනපතා ලැබෙන නිෂේධනීය ප්‍රචාර සමග, මෙම ප්‍රමාදකාරී ක්‍රියාව අර්ථකථනය කළ හැක්කේ පීඨය තවදුරටත් අගෞරවයට පත් කිරීම සඳහා ගැටලුව දිගුකාලීන ව පවත්වා ගැනීමට ගනු ලබන උත්සාහයක් ලෙස පමණි.

උක්ත කාරණා මත පදනම් ව සහ පරීක්ෂාකාරී හා දීර්ඝ සාකච්ඡාවකින් අනතුරු ව, පේරාදෙණි විශ්වවිද්‍යාලයයේ ශාස්ත්‍රපීඨ සභාව පහත තීරණ ඒකමතික ව සනාථ කරයි.

1. පරිපාලනය විසින් තීරණය කරනු ලැබ ඇති පරිදි, විශ්වවිද්‍යාලයය සහ පීඨය මගින් සැපයෙන **සියලු පොදු පහසුකම් භුක්ති විඳීමේ අයිතියට සහ/ හෝ පොදු ස්ථාන වෙත පිවිසීමට කිසිවෙකුට සීමා පැනවීමේ හැකියාවක්, කිසිදු තනතුරක් හෝ මතයක් දරන ශිෂ්‍ය කණ්ඩායම් සහ සංගම්වල කිසිදු ශිෂ්‍යයකුට නොමැත යන මූලධර්මයට සියලු ශිෂ්‍යයෝ බැඳී සිටිති.** මෙම මූලධර්මය සඳහා සියලු කණ්ඩායම් බැඳී සිටින බව දැක්වෙන ලිඛිත ගිවිසුමක් ශාස්ත්‍රපීඨාධිපතිතුමන් වෙත සාමූහික ව ලබා දිය යුතු ය. විශේෂයෙන්, තමන් ශිෂ්‍ය නියෝජිතයන් ලෙස හඳුන්වා ගන්නා ශාස්ත්‍රපීඨ ශිෂ්‍ය සංගමය මෙම මූලධර්මය පිළිගන්නා බව ලිඛිත ව දැනුම් දිය යුතු ය.

2. **ස්ත්‍රී පුරුෂභාවය හෝ දේශපාලනය, මතවාද, ආගම්, සංස්කෘති, භාෂා හෝ වෙනත් අගයන් සහ දර්ශන පාදක කර ගනිමින් ශිෂ්‍ය කණ්ඩායම් වෙනස් කොට නොසැලකිය යුතු ය.** ශිෂ්‍යයන් ගේ පොදු අයිතීන් සහ වරප්‍රසාද භුක්ති විඳීමේ දී යම් කණ්ඩායමක සාමාජිකත්වයකට විශේෂත්වයක් නොපැවතිය යුතු ය. සියලු ශිෂ්‍යයන් අනෙකාගේ අයිතියට ගරු කරමින් විශ්වවිද්‍යාලය නීතිවලට අනුගත විය යුතු අතර, අතීතයේ යම්කිසි වෙනස් කොට හෝ විශේෂ කොට සැලකීමක් පැවතියේ නම් එම තත්ත්වය වහා ම නැවතිය යුතු ය.

3. **සියලු ශිෂ්‍යයන්, විශේෂයෙන් ශාස්ත්‍රපීඨ ශිෂ්‍ය සංගමය සහ ශිෂ්‍ය නියෝජිතයන් උක්ත 1 සහ 2 කරුණුවලට ස්වකීය එකඟත්වය සැප්තැම්බර් 23 සිකුරාදා වන විට නිසි පරිදි ලිඛිත ව පළ නොකළ හොත් පීඨය සියලු අධ්‍යයන කටයුතු ද ශිෂ්‍යයන් සමග සිදු කෙරෙන කටයුතු ද (භෞතික ව හෝ මාර්ගගත ව දේශන පැවැත්වීම, සාකච්ඡා පන්ති, ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහ වෙනත් අදාළ කටයුතු) නැවත දැනුම් දෙන තුරු අත්හිටුවයි.** පීඨයෙහි සියලු සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයෙහි ආරක්ෂාවත් කීර්තියත් තහවුරු කිරීම සඳහා වෙනත් විකල්පයක් නොමැති බැවින් මෙම අවසන් තීරණය ගනු ලබන්නේ කනගාටුවෙනි.

2022 සැප්තැම්බර් 20 දින විශ්වවිද්‍යාලයයේ ශාස්ත්‍රපීඨ සභාවෙහි ඒකමතික එකඟතාවකින් මෙම නිවේදනය නිකුත් කරන ලදි.

මහාචාර්ය ජේ. එම්. ආනන්ද ජයවික්‍රම

වැඩ බලන පීඨාධිපති

ශාස්ත්‍රපීඨය

2022. 09. 22.